- 120


# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
## காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
## LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.


මගේ අංකය / எனது இல / MY NO: 4/1/ප්‍රතිපත්ති-2    ඔබේ අංකය / உமது இல / YOUR NO:    දිනය / திகதி / DATE: 2014.09.

PL C Admin

29 SEP 2014

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,
සියලුම නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන් / සහකාර ඉඩම් කොමසාරිස්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

<u>රජයේ ඉඩම් කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යාපෘති සඳහා බදු පදනම මත ලබා දීම.</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් 2014.08.23 දිනැති, වැඩ බලන ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්ජේ/5/10/1/7 ලිපියට අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2014.09.17 දිනැතිව මා වෙත ලබා දී ඇති උපදෙස් හා බැදේ.

රජයේ ඉඩම් කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යාපෘති සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත පෞද්ගලික ආයතන හෝ පුද්ගලයින් වෙත ලබා දීමේදී පොදු ක්‍රමවේදයක් අනුගමනය කරනු වෙනුවට විවිධාකාරයෙන් කටයුතු කරනු ලබන බව අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට ලක්ව ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රමවේදයක් සකස් කරන තෙක්, අදාල බදුකරවල රාජ්‍ය මුද්‍රාව හා රජයේ ඉඩම් ආඥා පනතේ 23(2) වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමාගේ අත්සනෙන් මුද්‍රාව යොදා එය සහතික කරන තෙක් ඉඩමේ භුක්තිය අදාල පාර්ශවයන්ට භාර නොදීමට කටයුතු කරන ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි දන්වා ඇත.

ඒ අනුව දැනටමත් අනුමත කර, භුක්තිය භාර දීමට මවිසින් දන්වා ඇති එහෙත් මෙතෙක් භුක්තිය භාර දී නොමැති සියලු බදු දීම්වල භුක්තිය භාර දීමේ කටයුතු නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටුවන ලෙස මෙයින් දැනුම් දෙමි.

තවද අදාල බදුකර අනුමැතියට ඉදිරිපත් කිරීමට පෙර අදාල අධිකාරීන්ගෙන් හා ආයතනවලින් ලබා ගත යුතු අනුමැතීන් නිසි පරිදි ලබා ගැනීමට කටයුතු කළ යුතු බවද වැඩිදුරටත් දන්වා ඇති බැවින් මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලෙසද තවදුරටත් දන්වමි.

ආර්.පී.ආර්. රාජපක්ෂ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්: 1. ජනාධිපති ලේකම් - කාරුණික දැ.ගැ.ස.
2. ලේකම් - ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කාරුණික දැ.ගැ.ස.


දුරකථනය / தொலைபேசி: 011-2797400    ෆැක්ස් / பெக்ஸ்: 011-2864051    වෙබ් ලිපිනය / இணையம்: www.landcommdept.gov.lk    ඊමේල් / ஈ-மெயில்: landcom@landco